**හල්දුම්මුල්ල ප්‍රාදේශීය සභාව**
**බදුල්ල දිස්ත්‍රික්කය**
---------------------------

1. **මූල්‍ය ප්‍රකාශන**
----------------

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
---------------------------------

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 27 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර,එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 අගෝස්තු 30 වන දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 **තත්ත්වාගණනය කළ මතය**
--------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට හල්දුම්මුල්ල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
----------------------------------------

1.3.1 **ගිණුම්කරණ අඩුපාඩු**
----------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විශ්‍රාම වැටුප් දායක අරමුදලට ගෙවිය යුතු දායකය රු.1,656,301 ක් වුවත්, එය රු.1,689,251 ක් ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් වගකීම් රු. 32,950 කින් වැඩියෙන් දැක්වුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොලී රු.150,443 ක් වුවත්, එය රු.199,701 ක් ලෙස මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් කර තිබීම හේතුවෙන් ජංගම වත්කම් රු.49,258 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විවිධ ණයහිමියෝ රු.210,787 කින් අඩුවෙන් දක්වා තිබුණි

(ඈ) සමාලෝචිත වර්ෂයේ මුද්දර ගාස්තු ආදායම රු.5,615,608 ක් වුවත්, එය මූල්‍ය ප්‍රකාශන වල රු.4,743,739 ක් ලෙස දැක්වීම හේතුවෙන් අතිරික්තය හා ජංගම වත්කම් රු.871,869 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ උසාවි දඩ ආදායම රු.2,044,134 ක් වුවත්, එය මූල්‍ය ප්‍රකාශන වල රු.2,140,644 ක් ලෙස ගිණුම්ගතකර තිබීම හේතුවෙන් අතිරික්තය හා ජංගම වත්කම් රු.96,510 කින් වැඩියෙන් දක්වා තිබුණි.

1.3.2 නොසැසඳුනු ගිණුම්

-----------------------

මූලා ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.4,705,619 ක් වූ ගිණුම් විෂයයන් 03 කට අදාළ ශේෂයන් සහ ඒවාට අදාළ උපයෝගී ලේඛන හා වාර්තාවල දැක්වෙන ශේෂයන් අතර වෙනස්කම්වල එකතුව රු.624,699 ක් විය.

1.3.3 **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

------------------------------------

(අ) **ලැබිය යුතු ගිණුම්**

----------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.19,493,640 ක් වූ ලැබිය යුතු ගිණුම් ශේෂ තුළ වර්ෂ 02 ක් වූ හිඟහිටි වරිපනම් රු.248,327 ක්, හිඟහිටි ප්‍රාග්ධන ප්‍රතිපාදන රු.14,752,785 ක් , වර්ෂ 03 ක් වූ හිඟහිටි වෙනත් ආදායම් රු.3,072,524 ක් හා වර්ෂ 08 ක් වූ හිඟහිටි කඩ කුලී රු.699,770 ක්, වර්ෂ 02 ක් වූ හිඟහිටි බලපත්‍ර රු60,509 ක්, හිගහිටි ජල ගාස්තු රු.398,972 ක්, වර්ෂයක් කල්පසුවූ හිඟහිටි අක්කර බදු රු.154,074ක්, හිඟහිටි කඩකුලී රු3,100 ක්,බිම් බදුකුලී රු.103,579 ක් ඇතුළත් වී තිබුණි.

(ආ) **ගෙවිය යුතු ගිණුම්**

--------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.19,073,785 ක් වූ ගෙවිය යුතු ගිණුම් ශේෂ තුළ වර්ෂයක් වූ වියදම් ණයහිමියෝ රු.131,122 ක්, වර්ෂ 05 ක් වූ කර්මාන්ත ණයහිමියෝ රු.17,253,412 ක් හා වර්ෂ 25 ක් වූ විශ්‍රාම වැටුප් ණය හිමියෝ රු.1,689,251 ක් ඇතුළත් වී තිබුණි.

1.3.4 **විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

--------------------------------------------------------

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.59,229,132 ක් වූ ගිණුම් විෂයයන් 03 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය/සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

1.3.5 **අනුකූල නොවීම්**

-------------------

1.3.5.1 **නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්**

-----------------------------------------------------------------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | | **නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව** | **වටිනාකම** | **අනුකූල නොවීම** |
|---|---|---|---|---|
| | | ------------------------------ | ------------ | -------------------------------- |
| | | | රු. | |
| (අ) | | 1980 අංක 56 සහ 2000 අංක 53 දරන පනත්වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත | 56,000 | පරිසර බලපත්‍ර ලබාගත යුතු ව්‍යාපාර 14 ක් සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කර නොතිබුණි. |
| (ආ) | | 1988 ප්‍රාදේශිය සභා (මූලා හා පරිපාලන) රීති සංග්‍රහය | | |

| | | | | |
|---|---|---|---|---|
| | | රීති 164 | | ලේකම්වරයා විසින් බලය පවරන ලද නිලධාරියකු විසින් සභාවේ ගිණුම් පොත්පත් හා ලියකියවිලි දෛනිකව පරීක්ෂා කර නොතිබුණි. |
| (ඇ) | | 2008 ජනවාරි 25 දිනැති අංක 1533/16 දරන ගැසට් නිවේදනය | 16,800 | සභා බල ප්‍රදේශය තුල ක්‍රියාත්මක වූ ව්‍යාපාර 06 ක් සඳහා 2017 වර්ෂයට වෙළඳ බලපත්‍ර නිකුත් කර ආදායම් උපයාගෙන නොතිබුණි. |
| (ඈ) | | 1980 දෙසැම්බර් 31 දිනැති අංක 1980 / 46 දරන චක්‍රලේඛය | | වෙළඳපොල කඩ කාමර සඳහා මාසික බදු කුලිය රජයේ තක්සේරුකරුවකු මඟින් තක්සේරු කරවා ගත යුතු වුවද, සභාව සතු කඩ කාමර 37 ක් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |

2. **මූල්‍ය සමාලෝචනය**

----------------------

2.1 **මූල්‍ය ප්‍රතිඵල**

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.6,389,311 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.6,080,555 ක් විය.

2.2 **ආදායම් පරිපාලනය**

----------------------

2.2.1 **ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්**

------------------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබු ඇස්තමේන්තුගත ආදායම්,බිල්කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | **ආදායම් ප්‍රභවය** | **ඇස්තමේන්තු ගත ආදායම** | **බිල්කල ආදායම** | **රැස්කළ ආදායම** | **දෙසැම්බර් 31 දිනට මුළු හිඟය** | **ඇස්තමේන්තු ගත ආදායම** | **බිල්කල ආදායම** | **රැස්කළ ආදායම** | **දෙසැම්බර් 31 දිනට මුළු හිඟය** |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 2,415,070 | 2,154,860 | 1,937,507 | 553,423 | 2,195,364 | 2,145,432 | 1,586,925 | 598,282 |
| (ii) | කුලී | 1,689,520 | 802,920 | 1,444,603 | - | 1,453,760 | 800,490 | 1,499,880 | - |
| (iii) | බලපත්‍ර ගාස්තු | 498,100 | 490,730 | 565,130 | - | 946,200 | - | 715,780 | - |
| (iv) | වෙනත් ආදායම් | 3,860,000 | 6,884,384 | 2,432,850 | 4,642,666 | 4,115,000 | 6,451,282 | 3,731,594 | 2,719,688 |
| | එකතුව | 8,462,690 | 10,332,894 | 6,380,090 | 5,196,089 | 8,710,324 | 9,397,204 | 7,534,179 | 3,317,970 |

2.2.2 **ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය**

----------------------------------------

2017 දෙසැම්බර් 31 දිනට මුළු බිල් කළ ආදායම රුපියල් මිලියන 10 ක් වු අතර,වර්ෂය තුළදී රැස්කළ ආදායම රුපියල් මිලියන 6.3 ක් විය. කෙසේ නමුත්,වර්ෂය අවසාන වනවිටත් රුපියල් මිලියන 5 ක ආදායමක් රැස්කර ගැනීමට තිබුණු අතර,ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී හිඟ ආදායම් සියයට 57 කින් වැඩි වී තිබුණි.

2.2.3 **කුලී**

-----

වාර්ෂික අවසර පත්‍ර සඳහා ගාස්තු අය කිරීමට විධිමත් පරිදි අතුරු ව්‍යවස්ථා පනවා ගැසට් පත්‍රයේ පලකර නොතිබුණි. සභා තීරණය අනුව ත්‍රිරෝද රථ ගාල් සඳහා වාර්ෂික අවසර පත්‍රයකට රු.600 ක් අයකළ යුතු වුවත්, සභාවේ ලියාපදිංචි ත්‍රිරෝද 87 ක් සඳහා ගාස්තු අයකර නොතිබීම හේතුවෙන් රු.52,200 ක ආදායමක් සභාවට අහිමිවී තිබුණි.

2.2.4 **වෙනත් ආදායම්**

------------------

(අ) **දැන්වීම් පුවරු ආදායම්**

--------------------------

සභා බල ප්‍රදේශය තුළ දැන්වීම් ප්‍රදර්ශනය වෙනුවෙන් 1998 අගෝස්තු 23 දිනැති අංක 520/7 දරන අතුරු ව්‍යවස්ථාවේ 39 වැනි ඡේදය අනුව 2016 දෙසැම්බර් 02 දිනැති අංක 1996 දරන ගැසට් පත්‍රයේ සඳහන් ගාස්තු අයකළ යුතු වුවත්, නියැදි පරීක්ෂාවට අනුව රු.112,500 ක දැන්වීම් පුවරු ආදායමක් අයකර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි.

(ආ) **ජල ගාස්තු**

------------

පානීය ජල යෝජනා ක්‍රම 04 ක ජල පාරිභෝගිකයින් 141 ක් සඳහා ලබා දී තිබුණු ජල මනු අක්‍රිය වීම හේතුවෙන් මසකට රු.100 ක සාමාන්‍ය ස්ථාවර ගාස්තුවක් අයකර තිබුණු අතර, ජල මනු සවිකර පාරිභෝජන ඒකක ප්‍රමාණය මත ගාස්තු අයකර නොතිබුණි.

2.2.5 **උසාවි දඩ හා මුද්දර ගාස්තු**

--------------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු.1,937,664 ක් හා මුද්දර ගාස්තු රු.4,101,599 ක් විය.

3. **මෙහෙයුම් සමාලෝචනය**

-----------------------------

3.1 **කාර්යසාධනය**

-----------------

ප්‍රාදේශිය සභා පනතේ 3 වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය,පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහනරණය,පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත පරිදි වේ.

(අ) **අතුරු ව්‍යවස්ථා**

-----------------

1987 ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය අනුව ප්‍රධාන කාරණා 30 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතු වුවත්, 2017 දෙසැම්බර් 31 දිනට අතුරු ව්‍යවස්ථා 22 ක් පමණක් පනවා තිබුණි.

(ආ) **ක්‍රියාකාරී සැලැස්ම**

---------------------

සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරි සැලැස්මක් සකස් කර නොතිබුණි.

(ඇ) **ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

---------------------------------

2012 ඔක්තෝබර් 05 දිනැති අංක 1178/45 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රය අනුව සභාව විසින් ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව සම්මත කරගෙන නොතිබුණු නමුත් 2015,2016,හා 2017 වර්ෂ වලදී කසළ බදු අයකිරීමට කටයුතු කර නොතිබුණු අතර,ඒ හේතුවෙන් සභාවට රු. 50,000 ක ආදායමක් අහිමි වී තිබුණි.

(ඇ) **තිරසර සංවර්ධන ඉලක්ක**

------------------------------

තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව දැනුවත්ව නොසිටීම හේතුවෙන් එම අරමුණු සඳහා වන ගෝලීය දර්ශක තුළින් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගු කාලීන සැලසුම් 2017 දෙසැම්බර් 31 දින වනවිටත් සකස් කර නොතිබුණි.

3.2 **කළමනාකරණ අකාර්යක්ෂමතා**

----------------------------------

**(අ) නොපියවූ අත්තිකාරම්**

-------------------------

(i) 1994 වර්ෂයේ සිට පැවත එන අත්තිකාරම් රු. 271,110 ක් 2017 දෙසැම්බර් 31 දින වනවිටත් නිරවුල් කර නොතිබුණි.

(ii) 2014 වර්ෂයේ දී කිතුල්ගහ අරාව ග්‍රාම සංවිධානයට ලබාදී තිබුණු රු. 210,000 ක් වූ ඉදිකිරීම් අත්තිකාරම් 2017 දෙසැම්බර් 31 දින වනවිටත් පියවා නොතිබුණි.

(ආ) **ගොඩනැගිලි අයදුම්පත් අනුමත කිරීම සහ අනුකූලතා සහතික නිකුත් කිරීම**

-------------------------------------------------------------------------------------

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 49 හා 52 වගන්ති අනුව ප්‍රාදේශීය සභා සීමාව තුළ අනවසර ඉදිකිරීම් පරීක්ෂා කර නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගෙන නොතිබුණු අතර, සභාවේ ලේඛනවලට අනුව සභා සීමාව තුළ 2012 වර්ෂයේ සිට 2017 දෙසැම්බර් 31 දින දක්වා ගොඩනැගිලි අයදුම්පත් 105 ක් අනුමත කර තිබුණද, අනුකූලතා සහතික 25 ක් පමණක් නිකුත් කර තිබුණි.

(ඇ) **කොස්ලන්ද වෙළඳ සංකීර්ණය ඉදිකිරීම**

--------------------------------------------

සභාව විසින් දේශිය ණය සංවර්ධන අරමුදලින් ලබාගෙන තිබුණු ණය හා සභා අරමුදල් උපයෝගි කරගෙන රු.6,665,665 ක් වැය කර 2010 වර්ෂයේදී කොස්ලන්ද වෙළඳ සංකීර්ණය ඉදිකර තිබුණි. වෙළඳ සංකීර්ණයට ප්‍රවේශ මාර්ගය සකස් කර නොතිබීම හේතුවෙන් 2017 දෙසැම්බර් වනවිටත් ගොඩනැගිලි නිශ්කාර්යව තිබුණු අතර,සභාවට ලබාගත හැකිව තිබුණු ආදායම අහිමි වී තිබුණි.

3.3 **මානව සම්පත් කළමණාකරණය**

----------------------------------------

**(අ) සේවක පුරප්පාඩු හා අතිරික්ත**

---------------------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය පුරප්පාඩු 05 ක් හා අතිරික්තය 20 ක් විය.

(ආ) **සේවක ණය**

---------------

සභාවේ සිට සේවය හැර ගිය නිලධාරීන් දෙදෙනෙකුගේ හිඟ ණය ශේෂය රු. 25,220 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.4 **වත්කම් කළමණාකරණය**

-----------------------------

(අ) **වත්කම් වලින් ලැබිය යුතු ආදායම් ලබා නොගැනීම.**

--------------------------------------------------------

2017 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා කාලය තුළ සභාවට අයත් ජංගම ගිණුම් දෙකක රු.4,665,755 සිට රු.8,042,651 දක්වා ශේෂයක් පැවතියද, එම අතිරික්ත මුදල් ඵලදායි ආයෝජනයක යොදවා රු.500,393 ක පොලී ආදායමක් උපයා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) **පවරා නොගත් ඉඩම්**

----------------------

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 127 වගන්තිය අනුව සභාවට අයත් සුසාන භූමි මැණුම් කර නඩත්තු කළ යුතු වුවත්, සභාව සතුව අක්කර 35 ක සුසානභූමි 38 ක් පැවැතියද එම සුසානභූමි සඳහා ඔප්පු/පැවැරුම් නියෝග, මැනුම් නියෝග හා මායිම් වෙන්කර ඉඩම් ලේඛනයක ඇතුළත් කර නොතිබුණි.

3.5 **ප්‍රසම්පාදනය**

--------------

3.5.1 **ප්‍රසම්පාදන සැලැස්ම**

---------------------

සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි.

4. **ගිණුම් කටයුතු භාවය හා යහපාලනය**

----------------------------------------

4.1 **අයවැය පාලනය**

--------------------

සමාලෝචිත වර්ෂයට අදාල සභාවේ අයවැයගත ආදායම් හා වියදම්, තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේ දී විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් වශයෙන් උපයෝගී කරගෙන නොතිබුණි.

4.2 **අභ්‍යන්තර විගණනය**

----------------------

සමාලෝචිත වර්ෂය සඳහා සභාවේ අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.

4.3 **විගණන හා කළමනාකරණ කමිටු**

--------------------------------------

2017 වර්ෂය වෙනුවෙන් විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කර නොතිබුණි.

5. **පද්ධති හා පාලන**

--------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමු කර ඇති අතර, පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | **පද්ධතිය** | | **අඩුපාඩුව** |
|---|---|---|---|
| (අ) | ගිණුම්කරණය | (i) | ස්ථාවර වත්කම් පිරිවැය ගිණුම්ගත නොකිරීම. |
| | | (ii) | සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබූ ලෙජරයේ පිටපත් කිරීමේ දෝෂ තිබීම. |
| | | (iii) | සමීක්ෂණයෙන් හඳුනාගෙන තිබූ ඉඩම්, ඉදිකිරීම් හා ගොඩනැගිලි ලේඛනගත කර නොතිබීම. |
| | | (iv) | ගිණුම් විෂයයන් වටිනාකම එකිනෙක නොසැසඳීම. |
| (ආ) | ගබඩා පාලනය | (i) | නිකුතු නියෝග හා ලැබීම් පත්‍රිකා භාවිතා කර නොතිබීම. |
| | | (ii) | උප පත්‍රිකා පොත් නිකුත් කිරීමේ ලේඛණ පවත්වා නොගැනීම. |
| (ඇ) | කොන්ත්‍රාත් පාලනය | (i) | කොන්ත්‍රාත් ලේඛන පවත්වාගෙන නොතිබීම. |
| | | (ii) | ඉදිකිරීම් ලිපිගොනු නඩත්තු නොකිරීම. |
| (ඈ) | ණය පාලනය | (i) | හිඟ ආදායම් අයකර නොගැනීම. |
| | | (ii) | හිඟ ආදායම් ලේඛන නඩත්තු නොකිරීම. |
| (ඉ) | ස්ථාවර වත්කම් | (i) | ස්ථාවර වත්කම් ලේඛන නඩත්තු නොකිරීම. |
| | | (ii) | ස්ථාවර වත්කම් සමීක්ෂණය නොකිරීම. |